# 2019 සිංහල අවුරුදු චාරිත්‍ර - ඕස්ට්‍රේලියාව

**අවුරුදු උදාව**

2019 අප්‍රේල් මස 14 වන ඉරිදා ශ්‍රී ලංකා වේලාවෙන් පස් වරු 2:09 ට ද, සිඩ්නි, කැන්බරා, මෙල්බර්න්,බ්‍රිස්බේන් සහ හෝබාර්ට් නගර වල වේලාවෙන් පස් වරු 6:39 ට ද, ඇඩිලේඩ් සහ ඩාර්වින් නගර වල වේලාවෙන් පස් වරු 6:09 ට ද, පර්ත් නගරයේ වේලාවෙන් පස් වරු 4:39 ට ද, අලුත් අවුරුද්ද උදා වෙයි.

**පුණ්‍ය කාලය (නොනගතය)**

ඕස්ට්‍රේලියාවේ නගර වලට පුණ්‍ය කාලය සම්මත ඔරලෝසු කාලයෙන් පහත සඳහන් පරිදි වේ.

සිඩ්නි, කැන්බරා, මෙල්බර්න්, බ්‍රිස්බේන් සහ හෝබාර්ට් නගර වලට අප්‍රේල් මස 14 වන ඉරිදා පස් වරු 12:15 සිට සඳුදා පෙර වරු 1:03 දක්වා ද, ඇඩිලේඩ් සහ ඩාර්වින් නගර වලට 14 වන ඉරිදා පෙර වරු 11:45 සිට සඳුදා පෙර වරු 00:33 දක්වා ද, පර්ත් නගරයට 14 වන ඉරිදා පෙර වරු 10:15 සිට එදින පස් වරු 11:03 දක්වා ද පුණ්‍ය කාලය බැවින් එම කාලය ආරම්භ වීමට පෙර සියළු වැඩ අතහැර, පුණ්‍ය කාලයේ පෙර භාගය තුල ආගමික වතාවත් වල යෙදීමත් පුණ්‍ය කාලයේ අපර භාගය තුල පහත දැක්වෙන අයුරින් ආහාර පිසීම, වැඩ අල්ලීම, ගණුදෙනු කිරීම හා ආහාර අනුභවය ආදි චාරිත්‍ර ඉටු කිරීමත් යෝග්‍ය වේ.

**ආහාර පිසීම**

අප්‍රේල් මස 14 වන ඉරිදා රතු සහ කහ මිශ්‍ර වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර දිශාව බලා ඒ ඒ නගර වල සම්මත ඔරලෝසු වේලාවෙන් පහත සඳහන් වෙලාවන්ට ලිප ගිනි මොළවා හකුරු මිශ්‍ර කිරිබතක් ද අග්ගලා සහ කැවුම් ද පිළියෙල කර ගැනීම මැනවි.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| සිඩ්නි | පස් වරු | 7:43 | බ්‍රිස්බේන් | පස් වරු | 7:40 | ඩාර්වින් | පස් වරු | 6:54 |
| කැන්බරා | පස් වරු | 7:49 | හෝබාර්ට් | පස් වරු | 7:52 | පර්ත් | පස් වරු | 5:58 |
| මෙල්බර්න් | පස් වරු | 8:05 | ඇඩිලේඩ් | පස් වරු | 6:33 | | | |

**වැඩ ඇල්ලීම, ගණුදෙනු කිරීම හා ආහාර අනුභවය**

අප්‍රේල් මස 14 වන ඉරිදා රතු සහ කහ මිශ්‍ර වස්ත්‍රාභරණයෙන් සැරසී නැගෙනහිර දිශාව බලා ඒ ඒ නගර වල සම්මත ඔරලෝසු වේලාවෙන් පහත සඳහන් වෙලාවන්ට සියලු වැඩ අල්ලා ගණුදෙනු කොට ආහාර අනුභවය මැනවි.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| සිඩ්නි | පස් වරු | 8:47 | බ්‍රිස්බේන් | පස් වරු | 8:43 | ඩාර්වින් | පස් වරු | 8:46 |
| කැන්බරා | පස් වරු | 8:55 | හෝබාර්ට් | පස් වරු | 8:58 | පර්ත් | පස් වරු | 8:05 |
| මෙල්බර්න් | පස් වරු | 9:09 | ඇඩිලේඩ් | පස් වරු | 8:02 | | | |

**හිස තෙල් ගෑම**

අප්‍රේල් මස 17 වෙනි බදාදා නැගෙනහිර දිශාව බලා ඒ ඒ නගර වල සම්මත ඔරලෝසු වේලාවෙන් පහත සඳහන් වේලාවන්ට කොල පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී හිසට කොහොඹ පත් ද පයට කොළොන් පත් ද තබා තෙල් සහ කොහොඹ පත් යුෂ මිශ්‍ර නානු ද ගා ස්නානය කිරීම මැනවි.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| සිඩ්නි | පෙර වරු | 7:56 | බ්‍රිස්බේන් | පෙර වරු | 7:44 | ඩාර්වින් | පෙර වරු | 8:33 |
| කැන්බරා | පෙර වරු | 8:06 | හෝබාර්ට් | පෙර වරු | 8:19 | පර්ත් | පෙර වරු | 8:16 |
| මෙල්බර්න් | පෙර වරු | 8:24 | ඇඩිලේඩ් | පෙර වරු | 8:17 | | | |

සැකසුම: මහින්ද කරුණාරත්න, සිඩ්නි, ඕස්ට්‍රේලියාව. Email:mahindawk@gmail.com